# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස (උ.පෙළ) විභාගය - 2023(2024)

## ප්‍රතිඵල නැවත සමීක්ෂණය

## මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

## (පාසල් හා පෞද්ගලික අයදුම්කරුවන් සඳහා)

ප්‍රතිඵල නැවත සමීක්ෂණයේ දී අදාළ පිළිතුරු පත්‍ර සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිප දෙනෙකු යටතේ සම්පූර්ණයෙන් ම පරීක්ෂාවට ලක් කරනු ලැබේ. නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස Z ලකුණෙහි හෝ ලැබී ඇති ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ සිදුවිය හැකි බව අපේක්ෂකයින් විසින් දැනගත යුතු බව අවධාරණය කරමි.

1. **උක්ත විභාගයේ නැවත සමීක්ෂණ අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට පමණක් කැඳවනු ලැබේ.**
2. **අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පාසල් හා පෞද්ගලික අයදුම්කරුවන් තමන් විසින්ම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.**
3. **අයදුම්පත් භාරගැනීම 2024.06.05 දින ආරම්භ වන අතර 2024.06.19 දිනෙන් අවසන් වේ.**
4. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීම පහත දැක්වෙන ක්‍රම මගින් සිදුකල හැක.
   - විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (https://www.doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "Exam Information Centre" මත Click කිරීම මගින්.
   - විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (Mobile Application) වන DoE වෙත පිවිස "Exam Information Centre" මත Click කිරීම මගින්.
   - https://onlineexams.gov.lk/eic වෙත පිවිසීම මගින්
5. **ඔබට දැනටමත් පරිශීලක ගිණුමක් පවතී නම් පද්ධතියට පිවිසීමේ දී ඔබ අ.පො.ස. (උ.පෙළ) 2023(2024) විභාගයට පෙනී සිටි විභාග අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකයම භාවිතා කිරීමට සැලකිලිමත් විය යුතුය. පරිශීලක ගිණුමක් නොමැති නම් ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය ඇතුළත් කර ලියා පදිංචි විය යුතුය.**
6. අයදුම්පත් සම්පූර්ණ කිරීමට ප්‍රථම Technical Instructions, Common Instructions සහ උපදෙස් වීඩියෝව නැරඹීම, නිවැරදි ආකාරයට අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා අත්‍යාවශ්‍ය වේ
7. එක් විෂයයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු.250/- කි. Credit කාඩ් / Debit කාඩ් මගින් හෝ තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කළ හැකි ය.
8. මුදල් ගෙවීමෙන් පසු අයදුම්පත්‍රය PDF ක්‍රමයට බාගත(Download) කරගත හැකි අතර, එම අයදුම්පත්‍රය ඔබ භාරයේ තබා ගත යුතු ය. එසේම මුදල් ගෙවීමෙන් පසු ඔබගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක් ද ලැබෙනු ඇත.
9. ඔබට නැවත සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය සියලුම විෂයයන් සහිතව අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ. අදාළ ගාස්තුව ගෙවා නොමැති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍ර සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
10. විෂය අංක (12) - සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 30 කට වඩා අඩුවීම හේතුවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබූ අයදුම්කරුවන්ට එම විෂයය සඳහා ද නැවත සමීක්ෂණ අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.
11. මේ සම්බන්ධයෙන් කිසියම් විමසීමක් අවශ්‍ය වන්නේ නම් පහත දැක්වෙන දුරකථන අංක මගින් විමසීම් කළ හැකිය.

| | | |
|---|---|---|
| **පාසල් විභාග (ඇගයීම්) ශාඛාව** | - | **011-2785231 / 011-2785216 / 011-2784037** |
| **ක්ෂණික ඇමතුම් අංකය** | - | **1911** |

**එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර**
විභාග කොමසාරිස් ජනරාල්

පාසල් විභාග ඇගයීම් ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල
2024.06.05